කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍රවේදී අධ්‍යයන ධාරා උපාධි පරීක්ෂණය (භූගෝල විද්‍යාව) - දෙවන භාගය

දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2018

# GYG 3266- පරිසර දූෂණය හා කළමනාකරණය

පැ දෙකයි (02)

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න**

---

1. i. පරිසර දූෂණය යනුවෙන් අදහස් කරනුයේ කුමක්ද ? (ලකුණු 05)

   ii. පරිසර දූෂණයේ ප්‍රධාන මූලාශ්‍ර දක්වන්න. (ලකුණු 05)

   iii. ආසියාතික කලාපයේ කෘෂිකර්මික කටයුතු, පාංශු දූෂණය කෙරෙහි බලපා ඇති ආකාරය උදාහරණ සහිතව කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

2.

   i. වායු දූෂණය අම්ල වැසි ඇතිකරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

   ii දියුණු වෙමින් පවතින රටවල වායු දූෂණය අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 12)

3.

   i. "විකිරණශීලී දූෂණය" යනුවෙන් අදහස් කරනුයේ කුමක්ද ? (ලකුණු 04)

   ii. විකිරණශීලී දූෂණයට බලපාන හේතු සහ එහි ප්‍රතිඵල සඳහන් කරන්න. (ලකුණු 08)

   iii. දියුණු වෙමින් පවතින රටවල විකිරණශීලී දූෂණය අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග දක්වන්න. (ලකුණු 08)

4.

i. ඝන අපද්‍රව්‍යය සංයුතිය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද ? (ලකුණු 04)

ii. නාගරික ඝන අපද්‍රව්‍ය සම්බන්ධ අක්‍රමවත් කළමනාකරණය හා බැඳී පවතින ගැටලු දක්වන්න. (ලකුණු 08)

iii. ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියෙහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

5.

i. "පරිසර කළමණාකරනයේ දී දේශීය දැනම" යන්න කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

ii. පරිසරය සුරැකීමේ දී කාන්තා සහභාගිත්වයෙහි වැදගත්කම දක්වන්න. (ලකුණු 08)

iii. ශ්‍රී ලංකාවේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික අධ්‍යාපනය හා දැනුවත් කිරීම සහ ඉහල නැංවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

6.

i. ශ්‍රී ලංකාවේ පාරිසරික නීති සම්පාදනය කරන ආයතන 5 ක් නම් කරන්න. (ලකුණු 05)

ii. පාරිසරික බලපෑම් තක්සේරුකරණය ලෙස ( EIA ) ඔබ අදහස් කරනුයේ කුමක් ද ? (ලකුණු 05)

iii. පාරිසරික බලපෑම් තක්සේරුකරණ ක්‍රමවේදය ගැලීම් සටහනක් මගින් ඇඳ දක්වන්න. (ලකුණු 05)

iv. ශ්‍රී ලංකාවේ සංවර්ධන වැඩසටහන් සඳහා පාරිසරික බලපෑම් තක්සේරුකරණය අනුයුක්ත කිරීමෙහි ඇති පාරිසරික වැදගත්කම කෙටියෙන් විමසන්න. (ලකුණු 05)

000000